සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 84 S I

ශිල්ප කලා I

කාලය පැය 01 යි

සැලකිය යුතුයි.
* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 40 දක්වා අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

- **අංක 1 - 40 තෙක් ප්‍රශ්නවලදී දී ඇති පිළිතුරු අතරින් වඩා නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(01) අතීතයේ ලෝකුරුවන් ලෙස ප්‍රචලිත කාර්මිකයන් නිරතවූ පාරම්පරික කර්මාන්තයක් වන්නේ,
i ස්වර්ණාභරණ කර්මාන්තය ii වෙස් මුහුණු කර්මාන්තය
iii පිත්තල කර්මාන්තය iv ලාක්ෂා කර්මාන්තය

(02) ශ්‍රී ලංකකේය අනන්‍යතාවය විදහා දක්වන වෙස් මුහුණු කර්මාන්තය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
i මාතර, අම්ලන්ගොඩ ii මාතලේ, හපුවිද iii කළුතර, දෙදියවල iv මහනුවර, හුරිකඩුව

(03) පහත සඳහන් ජ්‍යාමිතික හැඩතල අතුරින් ඝන වස්තුවක් වන්නේ,
i ත්‍රිකෝණය ii කේතුව iii වෘත්තය iv ෂඩාස්‍රය

(04) ---------------------- මෙම රේඛා වර්ගය උපයෝගී කර ගනු ලබන්නේ,
i සැඟි රේඛා දැක්වීමට ii සමමිතික බව දැක්වීමට
iii වස්තුවක පෙනෙන දාර දැක්වීමට iv ඡේදනය කළ යුතු ස්ථාන දැක්වීමට

(05) ජ්‍යාමිතික නිර්මාණයේදී භාවිතයට ගන්නා ප්‍රධාන රේඛා වර්ග ද්විත්වය වන්නේ,
i තිරස් රේඛා, සිරස් රේඛා ii ආනත රේඛා, වක්‍ර රේඛා
iii සමාන්තර රේඛා, වක්‍ර රේඛා iv සරල රේඛා, වක්‍ර රේඛා

(06) පහත සඳහන් ජ්‍යාමිතික හැඩතල අතුරින් විෂමපාද ත්‍රිකෝණයක් වන්නේ,

i ii iii iv

(07) චතුරස්‍රයක එකිනෙකට සම්මුඛව පිහිටි ශීර්ෂ හෙවත් කෝණික ලක්ෂ්‍ය දෙකක් යා කෙරෙන සරල රේඛාව හඳුන්වන්නේ,
i සමච්ඡේදනය ii ලම්භකය iii විකර්ණය iv කේන්ද්‍රික කණ්ඩය

(08) පහත රූපයේ දැක්වෙන්නේ වෘත්තයක් සමාන කොටස් හතරකට බෙදා ඇති ආකාරයකි. 1,2,3,4 මගින් දැක්වෙන වෘත්ත කොටස් හඳුන්වන්නේ,
i වෘත්ත පාද ii කුඩා වෘත්ත ඛණ්ඩ
iii වෘත්ත ජ්‍යාය iv මහා වෘත්ත ඛණ්ඩ



(09) සම්මුඛපාද දෙකක් පමණක් සමාන්තරව පිහිටයි. පාද දිගින් අසමානය. මෙය හඳුන්වන්නේ,
i රොම්බසය ii ත්‍රිපීසියම iii රොම්බාභය iv ආයත චතුරස්‍රය

(10) රූපයේ දක්වා ඇති පරිදි ABC කෝණය ජ්‍යාමිතික නිර්මාණ මගින් සමච්ඡේදනය කිරීමට භාවිතා කළ යුතු උපකරණ වන්නේ,
i කෝදුව හා කෝණමානය ii කෝදුව හා බෙදුම් කටුව
iii කෝදුව හා විහිත චතුරස්‍රය iv කෝදුව හා කවකටුව



(11) රෙදිපිළි පින්තාරු කිරීමට යොදා ගන්නා මූලික වර්ණ ලෙස සැලකෙන්නේ,
i නිල්,කහ,රතු ii කළු, සුදු, නිල් iii රතු, සුදු, කළු iv රෝස, සුදු,නිල්

(12) පින්සල් හඳුනා ගැනීම සඳහා අංකනය කර ඇත. එසේ අංකනය කිරීමට පදනම වන්නේ,
i පින්සල් සකස් කර ඇති හැඩය ii පින්සලෙන් කෙරෙන කාර්යය
iii යොදන ලද කෙඳි ප්‍රමාණය iv යොදා ඇති කෙඳි වර්ගය

(13) රෙදි පිළි පින්තාරු කිරීමේදී මූලික වර්ණ ප්‍රභේදයකට සුදු හෝ කළු පැහැය එක් කිරීමෙන් සකස් කරනු ලබන වර්ණ
i ද්විතියික වර්ණ ii චතුර් වර්ණ iii තෘතීයික වර්ණ iv මොනෝක්‍රෝම් වර්ණ

(14) රෙදි පිළි පින්තාරු කිරීමේ දී අභිමත වර්ණයකින් සමස්ත මෝස්තරයම පුරවා ගැනීම
i සේදුම ii අඳුරුකරණය iii යටි ආලේපය iv අධි ආලෝකකරණය

(15) රෙදි පිළි අලංකරණයේදී සිදු කරන පෙර පිරියම් ක්‍රම අතුරින් කෙඳිවල පවතින ස්වභාවික හා බාහිර අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,
i කැඳහරණය ii මලහරණය iii විරංජනය iv කාබනීකරණය

(16) රෙදිපිළි අලංකරණයේදී ඒකාකාරී නොවූ විවිධත්වයෙන් යුතු මෝස්තර රටා ලබා ගැනීමට හැකියාවක් ඇති පහසු ක්‍රමයක් වන්නේ,
i සිදුරු තහඩුපත් මුද්‍රණය ii නූල් මුද්‍රා තැබීමේ ක්‍රමය
iii අච්චු මුද්‍රණ iv සේද රාමු මුද්‍රණය

(17) රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේදී හණ කෙඳි වලින් වියනු ලබන රෙදි හඳුන්වන නාමය,
i මස්ලීන් ii පොප්ලින් iii විස්කෝස් iv ලිනන්

(18) රෙදි නිෂ්පාදනය සඳහා යොදා ගන්නා බැටළු වර්ග අතරින් ඉතා උසස් ලෝම ලබා ගත හැකි බැටළු වර්ගය,
i මැරිනෝ ii දික්ලොම් iii දෙමුහුන් iv මස්

(19) කාශ්මීර සළු වියා ගැනීමට යොදා ගන්නා සත්ත්වයා වන්නේ,
i ලාමා ii ඇල්පකා iii එළුවා iv විකුණා

(20) කෙඳි හඳුනා ගැනීමේ සරල පරීක්ෂණයක් වන පිළිස්සුම් පරීක්ෂාවේදී පිහාටු පිළිස්සෙන ගඳ වහනය වන කෙඳි වර්ගය වන්නේ,
i ලෝම ii ලිනන් iii කපු iv කෘතීම සේද

(21) මල්පීස්, වොයිල්, නැන්සුක් වැනි රෙදි වර්ග වියා ගැනීම සඳහා යොදා ගැනෙන වියමන් රටාව වනුයේ,
i ජටා වියමන ii සැටින් වියමන iii චාම් වියමන iv හරස් දොර වියමන

(22) පහත දැක්වෙන වියමන් රටාව හඳුන්වන නාමය වන්නේ,

i දික්දාර වියමන ii සැටින් වියමන
iii ජටා වියමන iv හීරි වියමන

(23) පහත දැක්වෙන රිබන් එම්බ්‍රොයිඩර් සඳහා භාවිතා වන මැහුම් ක්‍රමය වන්නේ,
i ලේසි ඩේසි මැස්ම ii කෙලින් මැස්ම iii නැටි මැස්ම iv රිබන් මැස්ම

(24) වූල් ආධාරයෙන් ගෙතීමේදී ඕනෑම ගෙතුමක් ආරම්භ කරනුයේ,
i පත්තෑයා පටියා ගෙතීම ii දම්වැල ගෙතීම iii තනිපට පිරවිලි ගෙතීම iv දෙපට පිරවිලි ගෙතීම

(25) රෙදි කැබලි ආශ්‍රිත සැහැල්ලු සෙල්ලම් භාණ්ඩයක් වන පෙන්ගුයින් මැසීම සඳහා අවශය රෙදි කැබලි ප්‍රමාණය
i 13 ii 10 iii 15 iv 8

(26) ළදරු තොප්පිය වූල් ආශ්‍රිතව ගෙතීමේදී භාවිත කළ යුතු ගෙතුම් කටුවේ නොම්මරය වන්නේ,
i 10 ii 08 iii 15 iv 12

(27) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඇලුමිනා සිලිකේට් අණුවක අන්තර්ගත සංයෝගය වන්නේ,
i ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන් ඩයොක්සයිඩ්, ජලය
ii පොටෑසියම්, ටයිටේනියම්, කැල්සියම්
iii පෙල්ඩ්ස්පාර්,සිලිකා,ඩොලමයිට්
iv ඇලුමිනියම් ඩයොක්සයිඩ්, සිලිකන් ඔක්සයිඩ්, මයිකා

(28) ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා පැවතිය යුතු මැටිවල ඇති භෞතික හා රසායනික ගුණ ඇතුළත් පිළිතරු වන්නේ,
i නම්‍යතාවය, භංගුරතාව, තන්‍යතාව, වර්ණය ii සුඝනම්‍යතාව, සච්ඡිද්‍රතාව, තන්‍යතාවය, වර්ණය
iii සුවිකාර්යතාව, සච්ඡිද්‍රතාව, හැකිළීම,වර්ණය iv ඝනත්වය, හැකිළීම,නම්‍යතාව, වර්ණය

(29) මැටි පස නිර්මාණය වීමේ දී එම ස්ථානයේම තැන්පත් වන මැටි හඳුන්වන නාමය,
i ෆෙල්ඩ්ස්පාර් ii ප්‍රාථමික මැටි iii කෙඔලිනයිට් මැටි iv අගම් මැටි

(30) රූපයේ දක්වෙන මැටි භාණ්ඩ සෑදීමට සුදුසු ක්‍රම ශිල්පය වන්නේ,
i මැටි තහඩු ක්‍රමය ii සකපෝරුවේ ඉදිකිරීම
iii දරණු ක්‍රමය iv ඇඹීමේ ක්‍රමය



(31) මැටි වල පවතින සුවිකාර්යතා ගුණය යනුවෙන් හැඳින්වෙන්නේ,
i මැටිවල අඩංගු යකඩ ප්‍රතිශතය ii මැටිවල ඇති නම්‍යතාවය
iii මැටිවල ඇති ජලය උරා ගැනීමේ හැකියාව iv වියළීමේ පරිමාව අඩුවීම

(32) මැටි දරණු මඟින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී මැටි දරණු පිටතින් සම්බන්ධ කර ගැනීම සඳහා කළ යුත්තේ,
i මැටි පාප්ප ආලේප කිරීම.
ii මැටි දරණු කඩතොලු කර මැටි පාප්ප ගා ඇලවීම.
iii මැටි දරණු එකමත තබා අලවා ගැනිම.
iv රටාවන් අනුව මැටි දරණු කිහිපයක් සම්බන්ධ වන සේ ටුවකින් සිරීම.

(33) ශ්‍රී ලංකාවේ කෙඔලින් මැටි නිධි වලින් වඩාත්ම පිරිසිදු නිධිය වනුයේ,
i බොරලැස්ගමුව ii මීටියාගොඩ iii ඉරනමඩු iv කොච්චි කඩේ

(34) භාණ්ඩ පිළිස්සීමට පෙර සහ පසුවද සුදු පැහැයෙන් දිස්වන මැටි වර්ගය වනුයේ,
i කෙඔලින් මැටි ii තලප මැටි iii ගිනිමැටි iv මකුළුමැටි

(35) ප්‍රාථමික මැටි භාවිතයෙන් නිපදවන භාණ්ඩයක් නොවන්නේ
i දන්තාලේප ii පෝසිලෙන් iii තීන්ත iv වළං

(36) භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක බලපෑම් මත පාෂාණ ජීර්ණය ක්‍රියාවලියට බලපෑ හේතුවක් වන්නේ,
i පාෂාණ, තෘණ ii සූර්යතාපය,වැස්ස iii බැක්ටීරියා,ශාක බීජ iv අම්ල, කාබනික

(37) උද්‍යාන අලංකරණයේදී මූර්ති ගොඩනැගීමේ දී ශිල්පීය ක්‍රම භාවිතා වන අතර අදාළ නිර්මාණය සම්පූර්ණයෙන් මතු කර ගොඩනැගීම හා ආබද්ධව ගොඩ නැගීම කරන ශිල්පීය ක්‍රමය වන්නේ,
i අල්ප උන්නත ii අර්ධ උන්නත iii පූර්ණ උන්නත iv කැටයම්

(38) උද්‍යාන මූර්තියක දීප්තිමත් මතුපිටින් හා දිගු කල් පැවැත්ම සඳහා වඩා සුදුසු පසු පිරියම් ක්‍රමයකි.
i වාර්නිෂ් ආලේප කිරීම ii සිමෙන්ති දියර ආලේප කිරීම
iii ප්ලාස්ටර් ඔෆ් පැරිස් ආලේප කිරීම iv තීන්ත ආලේප කිරීම.

(39) උද්‍යානයක නිරාවරණය වූ ස්ථානයක තැබීමට සුදුසු නිර්මාණයක් සිදු කිරීමට වඩා සුදුසු මාධ්‍ය වන්නේ,
i පදම් මැටි ii ලී කුඩු iii සිමෙන්ති iv දැව

(40) පහත සඳහන් දෑ අතුරින් උද්‍යාන අංලකරණය සඳහා යොදා ගැනීමට වඩාත්ම සුදුසු
i මියුරල් සැරසිල්ලකි ii මල් බඳුනකි. iii බිම් ගඩොල්ය iv පොකුණකි

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 84 S II

ශිල්ප කලා II

කාලය පැය 02 යි

සැලකිය යුතුයි.

* පළමු වන ප්‍රශ්නයද තෝරාගත් තවත් ප්‍රශ්න හතරක්ද ඇතුළුව තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) ශිල්ප කලා විෂය හදාරා පාසැල් හැර යන අය ස්වයං රැකියා අවස්ථා උදාකර ගැනීම පිණිස පාසල තුළ ශිල්ප කලා සංගමයක් පිහිටුවා විසිතුරු ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

I මෙම ශිල්ප කලා සංගමය සඳහා නිර්මාණශිලි තේමාපාඨයක් ලියන්න.

II මෙම සංගමය හා ප්‍රදර්ශනය නැරඹීමට ඇරයුම් කිරීම සඳහා සුදුසු තනි පිටුවේ ආරාධනා පත්‍රයක් නිර්මාණශීලිව සකස් කරන්න.

III ප්‍රදර්ශනයේ සංවිධායක මණ්ඩලය සඳහා පැළඳීමට සුදුසු ලාංඡනයක දළ රූප සටහනක් ඇඳ දක්වන්න.

IV උත්සව අවස්ථාවේදී ආරාධිත අමුත්තා පිළිගැනීමට සුදුසු මල් මලාවක දළ රූප සටහනක් ඇඳ දක්වන්න.

V ප්‍රදර්ශනයේ පිවිසුම් දොරටුව ගොක්කොළ ආධාරයෙන් අලංකාර කර ගැනීමට සුදුසු ජටා වියමන ඇඳ දක්වන්න.

VI ප්‍රදර්ශනයට තැබීම සඳහා ඇඹීම මගින් නිර්මාණය කළ හැකි මැටි ආශ්‍රිත සත්ත්වයින් දෙදෙනකුගේ රූප සටහන් දෙකක් ඇඳ දක්වන්න.

VII ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීමට සුදුසු කුෂන් කවරයක් සඳහා පැච්වර්ක් මෝස්තරයක් ඇඳ දක්වන්න.

VIII ප්‍රදර්ශන ආරම්භක අවස්ථාවේ පාසලේ නර්තන කණ්ඩායම විසින් නර්තනයන් ඉදිරිපත් කරනු ලබන අතර එම බාලිකාවන්ගේ ඇඳුම් සඳහා අතින් පින්තාරු කිරීමට සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න.

IX ප්‍රදර්ශනයේ දක්ෂතා එළිදැක්වූ ජයග්‍රහකයින් සඳහා පිරිනැමීමට සුදුසු ජය සංකේතයක ආකෘතියක් ඇඳ දක්වන්න.

X එම ජය සංකේත ඇතුළත් කිරීම සඳහා සෘජුකෝණාසාකාර පැති සහිත පෙට්ටියක්ද සුදානම් කර ඇත. එහි විකසනය ඇඳ දක්වන්න.

(02) රෙදි පිළි අලංකරණය කර ගැනීමට විවිධ ක්‍රම භාවිතා කරයි.

I අතින් පින්තාරු සිදු කිරීමේදී මුද්‍රණ තලයක් සකස් කරන ආකාරය කෙටියෙන් ලියන්න.

II සිදුරු තහඩු මුද්‍රණය සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න.

III අච්චු මුද්‍රණය ආශ්‍රිතව කුෂන් කවරයක් අලංකාර කර ගන්නා ආකාරය ලියා දක්වන්න.

(03) ස්වභාවික පොළවේ පවතින මැටි පස තුළින් විවිධ නිර්මාණ සිදු කරයි.

I භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගැනෙන ප්‍රධාන මැටි වර්ග මොනවාද?

II මැටි පස නිර්මාණය වීමට බලපාන ප්‍රධාන සාධක හතරක් නම් කරන්න.

III යන්ත්‍රානුසාරයෙන් මැටි තහඩු සකස් කිරීමේදි යොදනු ලබන නොඇලෙන සුළු අමුද්‍රව්‍ය 2ක් හා ඇලෙන සුළු අමුද්‍රව්‍ය 2ක් නම් කරන්න.

(04) විවිධ ක්‍රම උපයෝගී කරගනිමින් රෙදි පිළි නිෂ්පාදනය සඳහා කෙඳි ලබා ගැනීම සිදු කරයි.

I පේෂකර්ම කෙඳි වර්ගීකරණයේ ප්‍රධාන අකාර මොනවාද?

II පොළවෙන් ලබා ගන්නා කෙඳිවර්ග හතරක් නම් කරන්න.

III කෙඳි නිෂ්පාදනය කිරීමෙන් අනතුරුව වියා ගනු ලබන රෙදි පිළි පෙර පිළියම් කිරීමේ වාසි 2 සඳහන් කර ඉන් එක් කරුණක් විස්තර කරන්න.

(05) මැටි පදම් කිරීම තුළින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය සඳහා වෙළඳපළ නිර්මාණය වී ඇත.

I මැටි පදම් කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක නම් කරන්න.

II මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම තුනක් නම් කරන්න.

III ඉන් එක් නිෂ්පාදන ක්‍රමයක් උපයෝගී කර ගනිමින් භාණ්ඩයක් නිෂ්පාදනය කර ගන්නා ආකාරය රූප සටහන් මඟින් පැහැදිලි කරන්න.

(06) සායම් භාවිතයෙන් මෙන්ම සායම් භාවිතයෙන් තොරවද විවිධ රෙදි පිළි අලංකරණය කරයි.

I සායම් භාවිතයෙන් තොරව සිදු කරන අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න.

II පබළු ආශ්‍රිත නිර්මාණය කළ හැකි බිත්ති සැරසිල්ලකට සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න.

III පේපර් කුවිලින් ආශ්‍රිතව නිර්මාණයන් කිරීමේ මූලික පියවර හතරක් නම් කරන්න.

(07) ගෘහයක අභ්‍යන්තර අලංකරණය මෙන්ම බාහිර අලංකරණයද ඉතා වැදගත්වේ.

I උද්‍යාන අලංකරණයන් සකස් කිරීමට භාවිත කරන මාධ්‍ය හතරක් නම් කරන්න.

II උද්‍යාන අලංකරණය සඳහා සුදුසු නිර්මාණයක් ඇඳ දක්වන්න.

III උද්‍යාන අලංකරණයේදී සැලකිය යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම 3ක් නම් කර ඉන් එක් මූල ධර්මයක් පිළිබඳ

වර්ෂ අවසාන පරීක්ෂණය - 2018
ශිල්ප කලා - 10 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

I පත්‍රය

01.	3	11.	1	21.	3	31.	2
02.	1	12.	3	22.	3	32.	4
03.	2	13.	4	23.	1	33.	2
04.	1	14.	3	24.	2	34.	1
05.	4	15.	2	25.	1	35.	4
06.	2	16.	2	26.	4	36.	2
07.	3	17.	4	27.	1	37.	3
08.	2	18.	1	28.	3	38.	1
09.	2	19.	3	29.	2	39.	3
10.	4	20.	2	30.	1	40.	1

(ලකුණු 1 x 40)

II පත්‍රය

(01) 2 x10 = 20

(02)	I	3	(05)	I	2
	II	3		II	3
	III	4		III	5
(03)	I	2	(06)	I	2
	II	4		II	4
	III	4		III	4
(04)	I	2	(07)	I	2
	II	4		II	3
	III	4		III	5

(ලකුණු 60)